---

**කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2013 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 අගෝස්තු 24 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 07 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය**

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2012 දෙසැම්බර් 31 දිනට කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

ඉපලෝගම ජල ව්‍යාපෘතියේ නිම්වැඩ වටිනාකම රු.27,234,086ක් ගිණුම් වලින් අත්හැරී තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

--------------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,146,077ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,845,183ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

---------------

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ)** 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.15,523,553ක් වූ අතර, අවුරුදු 01ක කාලයක් ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.1,731,769ක් විය.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,502,255ක් විය. අවුරුදු 01ක කාලයක් ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු. 965,460 ක් විය

### 2.3 ආදායම් පරිපාලනය

----------------------

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) | වරිපනම් හා බදු | 200 | 132 | 68 |
| (ii) | කුලී | 555 | 414 | 141 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 640 | 380 | 260 |
| (iv) | සේවා සඳහා ගාස්තු | 5,665 | 2,601 | 3,064 |
| (v) | වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 2,580 | 1,249 | 1,331 |
| (vi) | වෙනත් ආදායම් | 1,280 | 119 | 1,161 |

**2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් ගණනය කර ගිණුම් ගතකර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා වන ඇස්තමේන්තුගත අගයන් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 1,500,000 |
| (ii). | මුද්දර ගාස්තු | 1,000,000 |

**2.3.3 අක්කර බදු**

ප්‍රදේශය තුළ පිහිටි නිතිපතා ගොවිතැනට යොදා ගන්නා හෙක්ටයාර් 1ට නොඅඩු හෝ ඊට වැඩි ප්‍රමාණයෙන් යුතු ඉඩම් වලින් අක්කර බදු අයකළ යුතු වුවද, ප්‍රාදේශීය සභාව විසින් අක්කර බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි.

## 2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

------------------------------------------------

නියැදි විගණන පරික්ෂාවලදී අනාවරණය වූ පරිදි සභාව සතුව පැවති එකතුව රු.3,568,943ක් වටිනා ඉඩමක්, නිල නිවාසයක්, කඩ කාමර 05ක්, වාහන 05ක්, වර්ෂ 02ත් 05ත් අතර කාලයක් නිශ්කාර්යව හා ඌන උපයෝජිතව පැවත තිබුණි.

## 2.5 අවිධිමත් ගනුදෙනු

--------------------

(අ) මිළදී ගැනීමේ පටිපාටින්ට පටහැනිව සභාවේ මාර්ග කම්කරුවකු විසින් සභාපතිවරයාගේ අවශ්‍යතාවය මත සභාවේ ලියාපදිංචි නොවූ සැපයුම් කරුවකුගෙන් රු.23,925ක් වූ වීජි පහන් සමාලෝචිත වර්ෂයේදි මිළදී ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් රු.86,592ක් වැය කර සිදුකර තිබූ තබ්බෝව පල්ලිය හංදියේ සිට උප තැපැල් කාර්යාලය දක්වා දිග අඩි 3936ක ජලනල මාර්ගය දිර්ඝ කිරීම, ප්‍රමාණවත් ජල ධාරිතාවයක් නොමැතිවීමෙන් 2013 අගෝස්තු වන විටත්, ප්‍රයෝජනයට ගත නොහැකි වූ අසාර්ථක සංවර්ධන වැඩසටහනක් බවට පත්ව තිබුණි.

(ඇ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන රු.1,200,000ක් වැයකර 2011 වර්ෂයේ දී වැඩ ආරම්භ කර තිබූ මුණමල්ගස්වැව ජල ටැංකිය ඉදිකිරීම 2012 දෙසැම්බර් දක්වා වැඩ අවසන් කරගත නොහැකිවී තිබූ අතර, 2013 අගෝස්තු මස වන විටත්, ප්‍රදේශයේ ජනතාව වෙත ජලය ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ දී ඉන්ධන ඒකක පරිභෝජනය 54%කින් ඉහළ ගොස් තිබූ අතර, ඉන්ධන වියදම 128%කින් ඉහළ ගොස් තිබුණි. සභාපතිවරයා පාවිච්චි කළ කැබ්රථයේ ඉන්ධන ඒකක පරිභෝජනය 2011ට සාපේක්ෂව 75%කින් ඉහළ ගොස් තිබීමද වියදම 172%කින් ඉහළ යාමද විශේෂත්වයක් ගෙන තිබුණි.

(ඉ) සභාව විසින් 2011 වර්ෂයේ දී ඉදිකිරිම් කටයුතු අවසන් කර තිබු කුට්ටිගල් නිෂ්පාදනාගාරය මගින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු නිෂ්පාදනයක් සිදු කිරීමට අපොහොසත්ව තිබුණි.

(ඊ) සභා බල ප්‍රදේශයේ කැලි කසල ප්‍රශ්නයට විසඳුමක් ලෙස කසල කළමනාකරණය කෙරෙහි යොමුවීමට සභාව විසින් කිසිදු උත්සහායක් දරා නොතිබුණි.

(උ) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි

## 2.6 ඉපලෝගම ජල ව්‍යාපෘතිය

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි පූර්ණ අධීක්ෂණය මත ආසියානු සංවර්ධන බැංකු ණය, ආධාර හා සභා දායකත්වය යන ප්‍රතිපාදන මුලාශ්‍රයන්ගේ දායකත්වයෙන් ඉපලෝගම ප්‍රදේශයේ ජල ව්‍යාපෘතියක් රු.26,275,580ක පිරිවැයක් දරා සමාලෝචිත වර්ෂයේදි ක්‍රියාත්මක කර තිබුණි. 2013 ජනවාරි 24 දින කරන ලද භෞතික පරික්ෂාවේදි පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 ජනවාරි 04 දින වැඩ ආරම්භකර තිබුණි. ඉදිකිරීම් කටයුතු, ප්‍රමාද කිරිම මත 2012 ජුලි 12 දින දක්වා ව්‍යාපෘතිය භාරදීම සිදුකර නොතිබුණි.

(ආ) ජල ටැංකිය මුළු ධාරිතාවයට ජලය පිරවූ විට එහි ස්ථාන කිහිපයකින්ම ජලය කාන්දු වෙමින් තිබුණි.

(ඇ) ළිදෙහි සිට පොම්පාගාරය දක්වා වූ අඩි 31ක් නිරාවරණය වන කොටසක පීවීසී 4" බටයක් යොදා තිබුණි. ළිද පොළව මට්ටමින් ස්ථාන කිහිපයකදී ජලය කාන්දු වීම හා පිටත කෘෂි රසායන මිශ්‍රවන ජලය ළිදට කාන්දු වීම දක්නට තිබුණි.

(ඈ) ඉපලෝගම ජල ව්‍යාපෘතිය ඉදිකිරිමේ දී 20% අත්තිකාරම ඇතුළුව ගෙවීම් අවස්ථාවන් 5කදී රු.26,275,579ක මුදලක් කොන්ත්‍රාත් ආයතනය වෙත ගෙවීම් කර තිබු නමුත්, ඉන් එක් ගෙවීමකදී හෝ 10%ක රැඳවුම් රඳවාගෙන නොතිබුණි. එසේ රඳවාගත යුතු මුදල වූ රු.2,627,558ක් විය.

## 2.7 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) වාහන පාලනය